## ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුවේ

## ප්‍රජා විශෝධන නිලධාරින්ගේ ස්ථාන මාරු පටිපාටිය

**1. හැඳින්වීම**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2022 දෙසැම්බර් මස 14 වැනි බදාදා දින නිකුත් කරන ලද අංක 2310/29 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද කාර්ය පටිපාටික රීති I වැනි කාණ්ඩයේ XVIII වැනි පරිච්ඡේදයේ විධිවිධාන වලට අනුකූලව සැකසූ ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුවේ ප්‍රජා විශෝධන නිලධාරින් සඳහා වන ස්ථාන මාරු පටිපාටිය

1.1 සේවා අවශ්‍යතාවය මත කරනු ලබන ස්ථාන මාරු

සෑම මහේස්ත්‍රාත් අධිකරණයකටම අනුමතව ඇත්තේ ප්‍රජා විශෝධන නිලධාරි තනතුරු 01 බැගිනි. දැනට අනුමත තනතුරු සංඛ්‍යාවට වඩා නිලධාරින් එම අධිකරණයේ සිටී නම් එම ස්ථානයට පළමුවෙන් පත් කළ නිලධරයා එම ස්ථානයේ ස්ථිර නිලධරයා ලෙස සැලකේ. අනෙකුත් නිලධරයන් අතිරික්ත නිලධරයන් වන අතර, ඔවුන් ඕනෑම අවස්ථාවක සේවා අවශ්‍යතාවය මත කරනු ලබන ස්ථාන මාරුවීම්වලට යටත් වේ.

1.2 විනය හේතු මත කරනු ලබන ස්ථාන මාරු

1.3 සුහද ස්ථාන මාරු

සාමාන්‍ය රාජකාරි කටයුතුවලට බාධාවක් නොවන අවස්ථාවලදී පමණක් සලකා බලනු ලැබේ.

1.4 තාවකාලික අනුයුක්ත කිරීම්

නිලධරයන්ගේ හදිසි වූ ද සානුකම්පිතව සලකා බැලිය යුතු වූ ද කරුණුවලදී රාජකාරියට බාධා නොවන පරිදි සලකා බලනු ලැබේ.

**2. වාර්ෂික ස්ථාන මාරු සඳහා යටත් වන නිලධරයන් පිළිබඳ විස්තර**

ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුවේ මේ වන විට සේවයේ යෙදී සිටින ප්‍රජා විශෝධන නිලධාරින් අතුරින්,

2.1

i. සේවාවේ වසර 05 ක සේවා කාලයක් සම්පූර්ණ කරනු ලැබූ හා කිසියම් සේවා ස්ථානයක වසර 03ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරීහු ස්ථාන මාරුවීම් ඉල්ලා සිටීම සඳහා සුදුසුකම් ලබති.

ii. එක් සේවා ස්ථානයක ඛණ්ඩව හෝ අඛණ්ඩව වසර 05ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරින් ස්ථාන මාරුවීම්වලට යටත් වේ.

iii. එක් දිස්ත්‍රික්කයක සේවා කාලය තත්කාලයට (ස්ථාන මාරු සලකා බලන වසර වන විට) වසර 10ක් සම්පූර්ණ කර ඇති නිලධරයන් ස්ථාන මාරු කිරීම්වලට යටත් වේ.

iv. සේවා අවශ්‍යතාවය හා සුහද ස්ථාන මාරු මත ස්ථාන මාරු සිදුකරන ලද නිලධාරින් එම ස්ථාන මාරු සිදුකරන ලද දිනයේ සිට වසර 02ක සේවා කාලයක් සම්පූර්ණ කිරීමෙන් අනතුරුව වාර්ෂික ස්ථාන මාරුවීම් වලට යටත් වේ.

සත්‍ය පිටපතකි

ඒ.ඩී. නාකන්දල
සහකාර ලේකම් (පාලන)
අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය
කොළඹ 10.

2.2

2.1 (i) ඡේදය යටතට ගැනෙන නිලධාරියෙකු වෙනත් ස්ථානයකට මාරුවීම් ඉල්ලා ඇති විටෙක, එම ඉල්ලීම ඉටු කිරීම සඳහා 2.1 (ii) ඡේදයේ අවශ්‍යතා සපුරා ඇති එම ස්ථානයේ වැඩිම සේවා කාලයක් සහිත නිලධාරියා ඉන් පිටතට ස්ථාන මාරු කළ හැකිය.

2.3

i.සේවා කාලය ගණන් ගැනීමේ දී දිස්ත්‍රික්කයක් තුළ අඛණ්ඩව හෝ ඛණ්ඩව සේවා කාලවල එකතුව මුළු සේවා කාලයක් ලෙස ගණන් ගනු ලැබේ.

ii.දිස්ත්‍රික්කයක් තුළ සේවා කාලය ගණන් ගැනීමේදී එම දිස්ත්‍රික්කය තුළ කුමන කාර්යාලයක සේවය කළද දිස්ත්‍රික් සේවා කාලය ලෙස ගණන් ගැනේ.

iii.දෙපාර්තමේන්තුවේ සේවා කාලය ගණන් ගැනීමේදී නිලධාරියෙකුගේ පාලන විෂය ඉක්මවා ගිය හේතුවක් මත සේවයේ නොසිටි කාලය ගණන් ගනු නොලැබේ.

## 3. වාර්ෂික ස්ථාන මාරු කමිටුවේ සංයුතිය

i.ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව අයත් අමාත්‍යාංශයේ හෝ එම දෙපාර්තමේන්තුවේ හෝ අදාළ නියෝජ්‍ය ප්‍රධානියෙක් හෝ එවැනි තනතුරක් නොමැති අවස්ථාවක දී ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව අයත් රේඛීය අමාත්‍යාංශයේ හෝ එම දෙපාර්තමේන්තුවේ හෝ ජ්‍යෙෂ්ඨතම සහකාර ප්‍රධානියා;

ii.ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව අයත් රේඛීය අමාත්‍යාංශයේ හෝ එම දෙපාර්තමේන්තුවේ

හෝ අදාළ ආයතන කටයුතු භාර ජ්‍යෙෂ්ඨ රජයේ නිලධරයෙක්;

iii.

(අ) දෙපාර්තමේන්තුවේ හෝ ප්‍රස්තුත සේවයේ හෝ නියුක්ත මුළු නිලධර සංඛ්‍යාවෙන් 15% ක් හෝ ඊට වැඩි සාමාජික පිරිසක් සිටින යථෝක්ත දෙපාර්තමේන්තුවට නොහොත් සේවාවට අදාළ එක් එක් වෘත්තීය සංගමයේ

හෝ

(ආ) පූර්ණ කාලීනව වෘත්තීය සමිති කටයුතු සඳහා නිලධරයෙකු මුදාහැර ඇති එක් එක් වෘත්තීය සමිති සංගමයේ හෝ නියෝජිතයෙකුගෙන් සමන්විත විය යුතු වන්නේ ය.

## 4. වාර්ෂික ස්ථාන මාරු සමාලෝචනය

4.1වාර්ෂික ස්ථාන මාරු සමාලෝචන කමිටුවේ සංයුතිය

වාර්ෂික ස්ථාන මාරු කමිටුවක සේවය කළ නිලධරයෙකුගෙන් ද දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් නම් කරනු ලබන විධායක මට්ටමේ නිලධරයෙකුගෙන් ද බලය අභිනියෝජිත බලධරයා විසින් නම් කරන ලද විධායක මට්ටමේ නිලධරයන්ගෙන් ද වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටුව සමන්විත විය යුතු වන්නේය. ඒසේ වුවද, උපරිම සාමාජික සංඛ්‍යාව පස් දෙනෙකු නොඉක්මවිය යුතු වන්නේ ය.

සත්‍ය පිටපතකි

ලේකම්/[illegible]

ඒ.ඩී. නාකන්දල
සහකාර ලේකම් (පාලන)
අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය
කොළඹ 10.

CamScanner

4.2 ස්ථාන මාරු යෝජනාවන්ට විරුද්ධව කෙරෙන අභියාචනා ඉදිරිපත් කළ හැකි අවස්ථා

ස්ථාන මාරු යෝජනාවන්ට විරුද්ධව කෙරෙන අභියාචනා සලකා බැලීම සඳහා වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටුව විසින් පහත සඳහන් කරුණු පිළිබඳ පරීක්ෂා කර තීරණ ගනු ඇත.

4.2.1. ස්ථාන මාරු ප්‍රතිපත්තියට අනුකූල නොවන පරිදි කරන ලද මාරුවීම්

4.2.2. නිලධරයන්ගේ ඉල්ලීම් ඉටු නොවන අවස්ථා

4.2.3. නිලධරයන්ගේ ඉල්ලීම්වලට පටහැනි ලෙස කරන ලද මාරුවීම්

4.2.4. ස්ථාන මාරුවීම් අයදුම් කරන ලද දිනෙන් පසුව නිලධාරින්ට සිදු වූ හදිසි විපත්, කරදර, අසනීප වැනි සානුකම්පිත තත්ත්වයන් සම්බන්ධයෙන් පිළිගත හැකි නිර්දේශ ඉදිරිපත් කර ඇත්නම් ඒවා පිළිබඳව

**5. ස්ථාන මාරුවීම්වලදී සලකා බැලෙන පොදු ප්‍රතිපත්ති**

5.1 වාර්ෂික ස්ථාන මාරු පටිපාටියෙහි 2 යටතට ගැනෙන නිලධරයෙකු වෙනත් සේවා ස්ථානයකට මාරුවීමක් ඉල්ලා ඇති විටෙක, එම ඉල්ලීම ඉටු කිරීම සඳහා එහි දක්වා ඇති සුදුසුකම් සපුරා ඇති, එම ස්ථානයේ සේවය කරන නිලධරයෙකු ඉන් පිටතට ස්ථාන මාරු කළ හැකිය.

5.2 එක් සේවා ස්ථානයක ඛණ්ඩව හෝ අඛණ්ඩව වසර 05ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරියෙකුට එම සේවා ස්ථානයේ තව දුරටත් සේවය කළ හැක්කේ වෙනත් නිලධරියෙකු එම සේවා ස්ථානයට ඉල්ලීමක් සිදු කර නොමැති අවස්ථාවකදී පමණි.

5.3 යම් සේවා ස්ථානයකට ස්ථාන මාරුවීමට වැඩිම ඉල්ලීම් ප්‍රමාණයක් ඇති විට ඒ අතරින් වඩාත් සුදුසුම නිලධරයාගේ ඉල්ලීමට ප්‍රමුඛතාවය දෙනු ලැබේ.

5.4 සීමිත පදනමින් ප්‍රජා විශෝධන නිලධාරි තනතුරට පත්වී ඇති නිලධාරින් දෙදෙනෙකු එකම සේවා ස්ථානයකට ඉල්ලුම් කර ඇති විටෙක එම නිලධාරින් පූර්ව තනතුරෙහි සේවය කර ඇති සේවා කාලයන් කෙරෙහිද අවධානය යොමු කරනු ලැබේ.

5.5 ප්‍රියමනාප සේවා ස්ථානවලට මාරුවීම් ලබාදීමේදී ප්‍රමුඛතාවය දෙනු ලබන්නේ ප්‍රියමනාප ස්ථානවල සේවය නොකළ නිලධරයන්ට ය. මෙහිදී සේවා කාලය හා නිලධරයන් ඉදිරිපත් කොට ඇති ප්‍රායෝගික ගැටලු තත්ත්වයන් සැලකිල්ලට ගනු ලැබේ.

5.6 <u>සේවා කාලය ගණනය කිරීම</u>

5.6.1. වාර්ෂික ස්ථාන මාරුවීම්වලදී කාලය ගණනය කරනු ලබන්නේ පෙර වර්ෂයේ දෙසැම්බර් මස 31 වන දිනටය.

5.6.2. සේවයේ ආරම්භක දිනය ලෙස සැලකෙන්නේ සේවයට වාර්තා කළ වර්ෂයේ ජනවාරි මස පළමු වන දිනයයි. නමුත් නිලධරයාගේ පාලන විෂය ඉක්මවා ගිය කරුණක් හේතුවෙන් සේවයට වාර්තා කළ දිනය පසු දිනයක් වේ නම් ස්ථාන මාරු මණ්ඩලය ඒ පිළිබඳව සැලකිල්ල යොමු කරනු ලැබේ.

ඒ.ඩී. නාකන්දල
සහකාර ලේකම් (පාලන)
අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය
කොළඹ 10.

සත්‍ය පිටපතකි
[signature]
ලේකම්/[illegible]

5.6.3. නිලධරයාගේ පාලන විෂය ඉක්මවා ගිය හේතුවක් මත සේවයේ නොසිටි කාලය ස්ථාන මාරු සේවා කාලය සඳහා ගණන් ගනු නොලැබේ.

## 5.7 ප්‍රියමනාප සේවා ස්ථානවල සේවය ගණනය කිරීම

5.7.1. සේවා ස්ථාන වර්ගීකරණය

නිලධරයා පදිංචි ස්ථානය හා සේවා ස්ථානයට ඇති දුර ප්‍රමාණය අනුව සේවා ස්ථාන පහත පරිදි වර්ග කරනු ලැබේ.

| | | |
|---|---|---|
| i.ප්‍රියමනාප | - | කි.මී. 30 ට අඩු |
| ii.පහසු | - | කි.මී. 30 - කි.මී. 59 අතර |
| iii.දුෂ්කර | - | කි.මී. 60 - කි.මී. 100 අතර |
| iv.අති දුෂ්කර | - | කි.මී. 100ට වැඩි |

5.7.2. නිලධරයෙකුගේ සේවා කාලය තුළ ප්‍රියමනාප කාර්යාලයක උපරිම සේවා කාලය වසර 05 කි. කිසියම් නිලධරයෙකු නැවත වරක් ප්‍රියමනාප කාර්යාලයක් අපේක්ෂා කරන්නේ නම් වෙනත් නිලධරයෙකු එම කාර්යාලයට ඉල්ලීමක් කර නොමැති නම් ඒ පිළිබඳව සලකා බැලිය හැක.

5.7.3. ප්‍රියමනාප යැයි සැලකෙන සේවා ස්ථානයක දැනට සේවය කරන නිලධාරිනියකගේ සේවා කාලය ගණනය කිරීමේදී එම කාලය තුලදී ලබාගෙන ඇති ප්‍රසූත නිවාඩු (වැටුප් සහිත, අඩ වැටුප් හා වැටුප් රහිත) කාලය ගණනය කරනු නොලැබේ.

## 5.8 විශේෂිත කරුණු

5.8.1. සෑම නිලධරයෙකුම තම සේවා කාලය තුළ අති දුෂ්කර සේවා ස්ථානයක අවම වශයෙන් වසර 05ක් සේවය කළ යුතුය.

5.8.2. සෑම විටම නිලධරයාගේ ඉල්ලීම අනුව තම කලත්‍රයාගේ සේවා ස්ථානය අයත් ප්‍රදේශයට ආසන්න සේවා ස්ථානයකට මාරු වීම් ලබාදීමට හැකි සෑම උත්සාහයක්ම දරනු ලැබේ.

5.8.3. පාසල් යන දරුවන්, ආබාධිත දරුවන්, දීර්ඝ කාලීන අසනීප මත එක්තැන්ව සිටින කලත්‍රයන් සහ කලත්‍රයා විදේශගතව සිටින අවස්ථාවන් වැනි පිළිගත හැකි කරුණු ඇතිව ඉදිරිපත් කරන ඉල්ලීම් පිළිබඳව සැලකිල්ලට ගෙන මාරුවීම් සම්බන්ධව සලකා බලනු ලැබේ.

5.8.4. අවුරුදු 53 ඉක්මවූ නිලධරයන් දිස්ත්‍රික්කය තුළ වෙනත් ස්ථානයකට මාරු කළ හැකි වුවද ඔවුන්ගේ ඉල්ලීමක් නොමැතිව දිස්ත්‍රික්කයෙන් පිටතට මාරු නොකළ යුතුය.

5.8.5. වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු නියෝග ක්‍රියාත්මක වන දිනට වයස අවු. 58 ඉක්මවූ නිලධරයන් ඔවුන්ගේ ඉල්ලීමක් නොවන කල්හි දිස්ත්‍රික්කය තුළ වුවද මාරු නොකළ යුතුය.

5.8.6. ස්ථාන මාරු අයදුම් කිරීම හා ස්ථාන මාරු යෝජනාවලට විරුද්ධව කෙරෙන කරුණු දැක්වීම් නියමිත ආකෘතියෙන්ම විය යුතු අතර, එසේ නොවන අයදුම්පත් හා කරුණු දැක්වීම් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

5.8.7. ස්ථාන මාරු අයදුම් කිරීමට අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති නිලධරයන්ගේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

සත්‍ය පිටපතකි

ලේකම්/......

ඒ.ඩී. නාකන්දල
සහකාර ලේකම් (පාලන)
අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය
කොළඹ 10.

**6. වාර්ෂික ස්ථාන මාරු කාලසටහන**

| | |
|---|---|
| ජුනි 01 ට පෙර | වාර්ෂික ස්ථාන මාරු කමිටු පිහිටුවීම |
| ජුනි 30 ට පෙර | වාර්ෂික ස්ථාන මාරු දැන්වීම නිකුත් කිරීම |
| ජූලි 31 ට පෙර | සම්පූර්ණ කරන ලද වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත් අදාළ බලධාරියා වෙත ඉදිරිපත් කිරීම |
| අගෝස්තු 15 ට පෙර | අදාළ බලධරයා විසින් අයදුම්පත්‍ර ස්ථාන මාරු කමිටුවට භාරදීම |
| අගෝස්තු 31ට පෙර | වාර්ෂික ස්ථාන මාරු කමිටුවේ ස්ථාන මාරු යෝජනා අදාළ බලධරයා වෙත ලිඛිතව භාරදීම |
| සැප්තැම්බර් 15 ට පෙර | යෝජිත වාර්ෂික ස්ථාන මාරු කිරීම් පිළිබඳ දැන්වීම සහ වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටුව පිහිටුවීම |
| සැප්තැම්බර් 30 ට පෙර | ස්ථාන මාරුවීම් පිළිබඳ සමාලෝචන කමිටුව සඳහා අභියාචන භාරගැනීමේ අවසන් දිනය |
| ඔක්තෝබර් 15 ට පෙර | වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටුව විසින් යෝජිත ස්ථාන මාරු සම්බන්ධයෙන් වන තම ලිඛිත නිර්දේශ අදාළ බලධරයා වෙත ලිඛිතව භාරදීම |
| නොවැම්බර් 01 ට පෙර | අවසන් වාර්ෂික ස්ථාන මාරු නියෝග නිකුත් කිරීම |
| ජනවාරි 01 සිට | වාර්ෂික ස්ථාන මාරු නියෝග බලාත්මක කිරීම |

**7. වාර්ෂික ස්ථාන මාරු තීරණවලට එරෙහි අභියාචනා ඉදිරිපත් කිරීම**

7.1 ස්ථාන මාරු කිරීමක් පිළිබඳව දෙන ලද නියෝගයකට එරෙහිව කිසියම් රජයේ නිලධරයෙකු විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කරන්නේ නම්, එම අභියාචනය ආකෘති පත්‍ර ඇමුණුම 03 ප්‍රකාරව පමණක් ඉදිරිපත් කළ යුතු වන්නේ ය. තවද තමන් විසින් ඉදිරිපත් කරනු ලබන කරුණු තහවුරු කිරීමට අදාළ ලියකියවිලිවල සහතික කළ පිටපත් ඉදිරිපත් කළ යුතුය.

7.2 නිලධාරියෙකු විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කළ යුතු වන්නේ විෂය භාර අමාත්‍යාංශයේ ලේකම් මගින් වන අතර, එම අභියාචනයේ පිටපතක් අදාළ පරිදි දෙපාර්තමේන්තු ප්‍රධාන හා විෂය භාර අමාත්‍යාංශ ලේකම් වෙත ද යොමු කළ යුතු වන්නේ ය. තමන් වෙත ඉදිරිපත් වන අභියාචනය අප්‍රමාදව තම නිරීක්ෂණ සහිතව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කිරීම (ඇමුණුම 04 ආකෘතිය අනුව) ප්‍රජා පාදක විශෝධන කොමසාරිස්ගේ වගකීම වන්නේය. නිලධාරියාට තම කැමැත්ත පරිදි අභියාචනයේ ප්‍රගමන පිටපතක් සෘජුවම රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ හැක්කේ ය.

7.3 ස්ථාන මාරු කිරීමේ නියෝගයකට එරෙහිව ඉදිරිපත් කරනු ලබන අභියාචනයක්, එම ස්ථාන මාරු කිරීමේ නියෝගය ප්‍රසිද්ධියට පත්කරන ලද දින සිට දින 14 ක් ඇතුළත ඉදිරිපත් කළ යුතු වන්නේ ය. නියමිත කාලය තුළ දී ඉදිරිපත් නොවන අභියාචනා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ප්‍රතික්ෂේප කරනු ලබන්නේය.

7.4 රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කිරීම සඳහා නිලධාරියෙකු විසින් භාරදෙනු ලබන අභියාචනයට අදාළ සියලු ලිපිගොනු, ලිපි ලේඛන හා වාර්තා ආදිය ද, එයට අදාළ තම නිරීක්ෂණ ද නිර්දේශය සහිතව එම අභියාචනය ලැබී දින 15ක් ඇතුළත රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත්

ජේ.ඩී. නාකන්දල
සහකාර ලේකම් (පාලන)
අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය
කොළඹ 10.

සත්‍ය පිටපතකි

කිරීමට අදාළ ආයතන ප්‍රධානියා හා අමාත්‍යාංශ ලේකම්වරයා වග බලා ගත යුතු වන්නේ ය. එතකුදු වුවත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ XVIII පරිච්ඡේදයේ සඳහන් වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධව අභියාචනා අදාළ ලිපිගොනු, ලිපිලේඛන, වාර්තා, නිරීක්ෂණ හා නිර්දේශ සමඟ නොවැම්බර් 15 දිනට ප්‍රථම රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතු වන්නේය.

7.5 මෙම පරිච්ඡේදයේ සඳහන් නියමයන්ට අනුගතව තම අභියාචනා ඉදිරිපත් කිරීම සෑම රජයේ නිලධරයෙකුගේ වගකීම වන අතර, ඊට පටහැනිව ඉදිරිපත් කරනු ලබන අභියාචනා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සලකා බලනු නොලැබේ.

7.6 ඉහත 7.4 වගන්තියේ සඳහන් ලියවිලි ලැබී දින 15ක් ඇතුළත ස්ථාන මාරුකිරීමේ නියෝගයකට එරෙහිව රජයේ නිලධරයෙකු විසින් ඉදිරිපත් කර ඇති අභියාචනා සම්බන්ධයෙන් තීරණයක් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ගනු ඇත්තේ ය.

7.7 ඉහත සඳහන් පරිදි ඉදිරිපත් කර ඇති අභියාචනයක් සම්බන්ධයෙන් වන රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය සෘජුවම අභියාචක වෙත දන්වනු ලබන අතර, එහි පිටපතක් අදාළ පරිදි අමාත්‍යාංශ ලේකම් හා දෙපාර්තමේන්තු ප්‍රධානී වෙත යවනු ලබන්නේ ය.

7.8 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගයකින් හෝ තීරණයකින් අතෘප්තියට පත්වන රජයේ නිළධාරියෙකුට 2002 අංක 04 දරණ පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය පනතේ සඳහන් විධිවිධානවලට අනුකූලව පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරය වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීමට හිමිකම් ඇත්තේ ය.

සකස් කළේ;
අත්සන : ............................................
(විෂය භාර කණිෂ්ඨ මාණ්ඩලික නිලධාරියා)
නම : R.M.L.B. රත්නායක ............................
තනතුර : .........................................
දිනය : 2025/06/25 ............................

පරීක්ෂා කළේ;
අත්සන : ............................................
(විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරියා)
නම : ............................................
තනතුර : .........................................
දිනය : ............................................

ඒ.ඩී. නාකන්දල
සහකාර ලේකම් (පාලන)
ආගමික සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය
කොළඹ 10.

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

සත්‍ය පිටපතකි
......................
[illegible]

අත්සන : ............................................
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම : ............................................ දිලාන් කුලරත්න
කොමසාරිස්
තනතුර : ............................................ ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව
නිල මුද්‍රාව : ............................................
දිනය : 2025/06/25 ............................

යොමු අංකය : MOJ/A/50/1 AD/04/DCBC/ශ්.වා

2025.01.02 දිනැතිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුවෙහි ප්‍රජා විශෝධන නිලධාරි තනතුර සඳහා වන ස්ථාන මාරු පටිපාටිය සහතික කිරීම සඳහා නිර්දේශ කරමි.

අත්සන : ..........................................
නම : අයේෂා ජිනසේන
ලේකම්
අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය
දිනය : 24/10/2025

ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන
ලේකම්
අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය
අංක: 19, ශ්‍රී සංඝරාජ මාවත,
කොළඹ 10.

යොමු අංකය : PSC/GST/07-04/01/2017

ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුවෙහි ප්‍රජා විශෝධන නිලධාරි තනතුර සඳහා යෝජිත මෙම ස්ථාන මාරු පටිපාටිය 2017.08.24 හා 2018.01.12, 2018.06.26 හා 2025.01.02 දින සංශෝධනය කරන ලද දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදි.

අත්සන : ..........................................
නම : ඩබ්ලිව්. එච්. එම්. එම්. සී. කේ. දසනායක
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
දිනය : 2026.6.8

නිලමුද්‍රාව : ඩබ්ලිව්.එච්.එම්.එම්.සී.කේ. දසනායක
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
අංක 1200/9, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල

ඩබ්ලිව්.එච්.එම්.එම්.සී.කේ. ...
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
අංක 1200/9, රජමල්වත්ත ...

සත්‍ය පිටපතකි

ඒ.ඩී. නාකන්දල
සහකාර ලේකම් (පාලන)
අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය
කොළඹ 10.

ඇමුණුම 01

## ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුවේ ප්‍රජා විශෝධන නිලධාරි තනතුරේ
## වාර්ෂික ස්ථාන මාරුවීම් සඳහා ඉල්ලුම්පත්‍රය

1.

i. නිලධාරියාගේ සම්පූර්ණ නම (පත්වීම් ලිපියේ සඳහන් පරිදි) :-
..........................................................................................................
..........................................................................................................

ii. ජාතික හැඳුනුම්පත් අංකය :- ..........................................................................

iii. නිලධාරියාගේ ස්ථිර ලිපිනය :- ..........................................................................
..........................................................................

iv. නිලධාරියා දැනට පදිංචි ලිපිනය :- ..........................................................................
..........................................................................

2.

i. දැනට සේවය කරන කාර්යාලය :- ..........................................................................

ii. කාර්යාලය පිහිටි නගරය :- ..........................................................................

iii. මුල් පත්වීමේ දිනය :- ..........................................................................

3.

i. උපන් දිනය :- ................................................

ii. ස්ත්‍රී / පුරුෂ භාවය :- ................................................

4.

i. විවාහක / අවිවාහක බව :- ................................................

ii. දරුවන්ගේ විස්තර:-

| නම | වයස | ඉගෙනුම ලබන පාසල |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |

iii. කලත්‍රයාගේ නම :- ..........................................................................

iv. තනතුර :- ..........................................................................

v. සේවා ස්ථානය :- ..........................................................................

vi. කාර්යාල ලිපිනය :- ..........................................................................
..........................................................................

සත්‍ය පිටපතකි

ඒ.ඩී. නාකන්දල
සහකාර ලේකම් (පාලන)
අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය
කොළඹ 10.

vii. කලත්‍රයා ස්ථානමාරු සඳහා ඉල්ලීමක් කර තිබේ නම් ඒ කුමන සේවා ස්ථානයකටද?

......................................................................................................................................

......................................................................................................................................

5.

i. සේවයට ඇතුළත් වූ දවසේ සිට ස්ථාන මාරුවීම් ලැබූ උප කාර්යාලවල විස්තර (මෙම ආකෘතිය සම්පූර්ණ කිරීමේදී කාර්ය ස්ථාන ඉතා වැදගත් බව අවධාරණය කෙරේ. මෙහි ඉඩ ප්‍රමාණවත් නොවේ නම් මෙයට අනුරූප ඇමුණුමක් ඇතුළත් කරන්න.)

| සේවා කාලය | | මුළු කාලය | උප කාර්යාලය | සේවා ස්ථාන වර්ගීකරණය | දිස්ත්‍රික්කය | පදිංචි නිවසේ සිට දුර |
|---|---|---|---|---|---|---|
| සිට | දක්වා | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |

ii. නිලධාරියා ස්ථාන මාරුවීමට කැමති ප්‍රාදේශීය කාර්යාල 03ක් කැමැත්ත අනුව පිළිවෙළින් සඳහන් කරන්න.

| ප්‍රාදේශීය කාර්යාලය | පදිංචි ස්ථානයේ සිට දුර | දිස්ත්‍රික්කය | සේවා ස්ථාන වර්ගීකරණය අනුව |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |

6. ඉල්ලුම් කිරීමට හේතු:-

i. ......................................................................................................................................

ii. ......................................................................................................................................

iii. ......................................................................................................................................

සත්‍ය පිටපතකි
ලේකම්/අ.ජා.ඒ.අමාත්‍යාංශය

ඒ.ඩී. නාකන්දල
සහකාර ලේකම් (පාලන)
අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය
කොළඹ 10.

7. සඳහන් කිරීමට වෙනත් හේතු ඇත්නම්:-

.............................................................................................................................................................

.............................................................................................................................................................

.............................................................................................................................................................

.............................................................................................................................

ඉහත දක්වා ඇති තොරතුරු සත්‍ය බව මම ප්‍රකාශ කරමි. මා විසින් ඉහතින් සඳහන් කර ඇති තොරතුරු අසත්‍ය වුවහොත් මා හට විරුද්ධව විනයානුකූලව කටයුතු කළ හැකි බව මම දනිමි.

දිනය:- ............................................ නිලධාරියාගේ අත්සන:- ....................................

සත්‍ය පිටපතකි

ඒ.ඩී. නාකන්දල
සහකාර ලේකම් (පාලන)
අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය
කොළඹ 10.

ඇමුණුම 02

නම : ......................................................................................

තනතුර : ......................................................................................

ලිපිනය : ......................................................................................

ඔබේ අංකය : ............................................

දිනය : ............................................

කොමසාරිස්

ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව

**<u>යෝජිත ස්ථාන මාරුව සම්බන්ධයෙන් කරුණු දැක්වීම</u>**

ඔබගේ අංක ...................................................... හා ............................ දිනැති ලිපිය / යෝජිත ස්ථාන මාරු ලේඛනය මගින් මා ...................................................................... ට ස්ථාන මාරු කිරීමට යෝජිත බව දන්වා ඇත.

02. පහතින් විස්තර කරනු ලබන කරුණු මත එම ස්ථාන මාරුව අවලංගු කරන ලෙස / සංශෝධනය කරන ලෙස / නැවත සලකා බලන ලෙස රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති I කාණ්ඩයේ XVIII පරිච්ඡේදයේ 253(V) වන උපවගන්තිය ප්‍රකාරව ඔබගෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

i. ......................................................................................

ii. ......................................................................................

iii. ......................................................................................

03. ඉහත කරුණු සනාථ කිරීම සඳහා අදාළ පහත සඳහන් ලියවිලිවල සහතික කළ ඡායා පිටපත් මේ සමඟ යා කර ඇත.

i. ......................................................................................

ii. ......................................................................................

iii. ......................................................................................

04. මාගේ වාර්ෂික ස්ථාන මාරුව පහත සඳහන් සේවා ස්ථානයකට ලබා දෙන ලෙසද කාරුණිකව ඉල්ලා සිටිමි.

- පළමුවන මනාපය : ......................................................
- දෙවන මනාපය : ......................................................
- තුන්වන මනාපය : ......................................................

සත්‍ය පිටපතකි

..............................

[illegible]

..............................

අත්සන

ඒ.ඩී. නාකන්දල

සහකාර ලේකම් (පාලන)

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය

කොළඹ 10.

ඇමුණුම 03

**.................... වාර්ෂික ස්ථානමාරු තීරණ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනා ඉදිරිපත් කිරීම**

**අභියාචක නිලධරයා පිළිබඳ තොරතුරු**

අ. පෞද්ගලික තොරතුරු

| | | | |
|---|---|---|---|
| 1. මුලකුරු සමඟ නම | | | |
| 2. තනතුර හා පන්තිය | | | |
| 3. උපන් දිනය (අවු/මාස/දින) ...... / ........ / ........ | 04.වයස (20... .12.31) අවු .... මාස ..... දින .... | 5. ජාතික හැඳුනුම්පත් අංකය | 6. ස්ත්‍රී/පුරුෂ භාවය |
| 7. ස්ථිර ලිපිනය | 8. තාවකාලික ලිපිනය | 9. දුරකථන අංකය<br>කාර්යාලය:-<br>පෞද්ගලික:- | |
| 10. විවාහක/අවිවාහක බව | 11. කලත්‍රයාගේ නම | 12. කලත්‍රයාගේ රැකියාව හා සේවා ස්ථානය | |
| 13. දරුවන් ගණන | 14. ඔවුන්ගේ වයස | 15. ඉගෙනුම ලබන පාසැල් | |

ආ. සේවා තොරතුරු

| | |
|---|---|
| 16. තනතුරට පත් වූ දිනය:- | |
| 17. වර්තමාන සේවා ස්ථානය | 18. සේවා ස්ථානය පිහිටි නගරය |
| 19. වර්තමාන සේවා ස්ථානයට වර්තා කළ දිනය<br>අවු. ................. මාසය ....................... දිනය ........ | 20. වර්තමාන සේවා ස්ථානයේ සේවා කාලය<br>අවු ........... මාස ......... දින ......... |
| 21. ප්‍රතිලාභ ලබන (ඉතා ප්‍රියමනාප / ප්‍රියමනාප) සේවා ස්ථානයක/ස්ථානවල සේවය කර තිබේද? | |

| 22. රජයේ සේවයේ පූර්ව සේවා ස්ථාන | සේවා ස්ථානය | ප්‍රියමනාප/ ප්‍රියමනාප නොවන/ දුෂ්කර/ ඉතා දුෂ්කර | සේවා කාලය | |
|---|---|---|---|---|
| | | | සිට | දක්වා |
| | 1. | | | |
| | 2. | | | |
| | 3. | | | |
| | 4. | | | |
| | 5. | | | |
| | 6. | | | |

සත්‍ය පිටපතකි
[illegible]

ඒ.ඩී. නාකන්දල
සහකාර ලේකම් (පාලන)
අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය
කොළඹ 10.



CamScanner

ඈ. ස්ථාන මාරු ඉල්ලීම් පිළිබඳ තොරතුරු (අදාළ කොටුවේ ✓ ලකුණ යොදන්න)

| | | | | |
|---|---|---|---|---|
| 23 | වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු අයදුම් කර | ඇත | | ස්ථාන මාරු අයදුම් කර ඇත්නම් අයදුම් කර ඇති සේවා ස්ථානය<br>1. |
| | | නැත | | 2.<br>3. |
| ස්ථාන මාරු ලැබී තිබෙ නම් එම සේවා ස්ථානය | | | | |

| | | |
|---|---|---|
| 24. ස්ථාන මාරු සමාලෝචන කමිටුවට අයදුම් කර | ඇත | |
| | නැත | |

25. සමාලෝචන කමිටුව වෙත කරන ලද ඉල්ලීම

| | | |
|---|---|---|
| ස්ථාන මාරුව අවලංගු කිරීම | | ස්ථාන මාරුව සංශෝධනය කිරීමට ඉල්ලුම් කළේ නම් එසේ ඉල්ලුම් කළ සේවා ස්ථාන<br>01. |
| සංශෝධනය කිරීම | | 02. |
| නව ස්ථාන මාරුවක් ලබා ගැනීම | | 03. |

26. ස්ථානමාරු සමාලෝචන කමිටු තීරණය:-

27. ස්ථානමාරු සමාලෝචන කමිටු තීරණයට එරෙහිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීමට හේතු

1. ..................................................................................................................................

2. ..................................................................................................................................

3. ..................................................................................................................................

29. ඉහත හේතු සනාථ කිරීමට අදාළ ලිඛිත සාධකවල සහතික කළ පිටපත් පහත දැක්වෙන ඇමුණුම් වශයෙන් යා කර ඇත.

ඇමුණුම (01) ..............................................................................................................

ඇමුණුම(02) ..............................................................................................................

ඇමුණුම(03) ..............................................................................................................

30. ඉල්ලා සිටිනු ලබන සහන

1. ..................................................................................................................................

2. ..................................................................................................................................

3. ..................................................................................................................................

ඉහත දන්වා ඇති තොරතුරු සියල්ල සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි.

.............................................
දිනය

.............................................
අත්සන

සත්‍ය පිටපතකි

13

ඒ.ඩී. නාකන්දල
සහකාර ලේකම් (පාලන)
අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය
කොළඹ 10.

ඈ. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය

1. නිලධාරියා/නිලධාරිනිය විසින් ඉදිරිපත් කර ඇති ඉහත සඳහන් තොරතුරු ඔහුගේ/ඇයගේ පෞද්ගලික ලිපිගොනුව අනුව නිවැරදි බව සහතික කරමි.

2. 20....... වාර්ෂික ස්ථාන මාරුවීම් සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන අභියාචනය නිර්දේශ කරමි. / පහත සඳහන් හේතු මත නිර්දේශ නොකරමි.

i. ..............................................................................................................

ii. ..............................................................................................................

iii. ..............................................................................................................

.....................................
දිනය

.....................................
අත්සන

ඉ. ස්ථාන මාරු බලධරයාගේ නිර්දේශය

i. ස්ථාන මාරු චක්‍රය සම්බන්ධ වන නිලධරයින් ගණන:- ....................................

ii. අභියාචනය පිළිබඳ නිර්දේශය:-..............................................................................................................

..............................................................................................................

.....................................
දිනය

.....................................
අත්සන

සත්‍ය පිටපතකි

ඒ.ඩී. නාකන්දල
සහකාර ලේකම් (පාලන)
අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය
කොළඹ 10.



CamScanner